**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය** - 2017

---------------------------------------------------------------

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ජූලි 20 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු. 508,434,195 ක් වූ රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද සටහන් 1 යටතේ වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මඟින් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් මාරු කරනු ලබන ප්‍රමාණාත්මක වටිනාකමක් රහිත වටිනාකම් ගිණුම්ගත නොකිරීමට තීරණය කර තිබුණු නමුත් ප්‍රමාණාත්මක සීමාව හඳුනාගෙන නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිගණක සහ උපාංග වලට අදාළ පෙර වර්ෂයේ සිදුකර තිබූ රු. 75,347 ක ඌන ක්ෂය ගණනය නිවැරදි කිරීම සඳහා පෙර වර්ෂයේ ලාභයට ගැළපිය යුතු වුවත් ප්‍රවර්තන වර්ෂයේ ලාභයට ගැළපීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතන හා සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) මගින් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ රු. 839,000 ක් වූ පරිගණක 10ක වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමට තීරණය කර තිබූ රු. 412,500 ක් වටිනා අතේ ගෙන යා හැකි ක්ෂුද්‍ර පරිගණක (laptop) 03ක් මිලදීගෙන නොතිබියදී එම වත්කම් ගිණුම් ගත කිරීම හේතුවෙන් එම වටිනාකමෙන් පරිගණක උපාංග ගිණුම හා විවිධ ණයහිමි ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතන හා සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් ලද රු. 987,178 ක් වූ පරිගණක 10 සහ සර්වර් (Server) එකෙහි වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කිරීම වෙනුවට ආදායම් ප්‍රකාශනයට බැර කර තිබුණි. එසේම මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීමේදී එම වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම්වල ජංගම නොවන වත්කම් මිලදී ගැනීම් ලෙස දක්වා තිබුණි .

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2015 වර්ෂයේදී මුද්‍රණය කරන ලද දිනපොත් වෙනුවෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 492,000 ක මුදල 2017 වර්ෂය තුළදී ලැබී නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය ගිණුමෙහි දීර්ඝකාලීනව පැවති රු. 54,240 ක අසාමාන්‍ය බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ වෙළඳ ණය ගැතියන් සඳහා වූ ඇමුණුම අනුව ජාතික සමූපකාර සංවර්ධන ආයතනයෙන් අයවිය යුතු මුදලක් ලෙස පෙර වර්ෂවල සිට පැවත එන රු. 31,219 ක් තිබූ අතර, ජාතික සමූපකාර සංවර්ධන ආයතනය විසින් 2017 සැප්තැම්බර් 18 දිනැති ලිපිය පරිදි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් රු. 61,430 ක මුදලක් ගෙවිය යුතු බව දන්වා තිබුණි. එසේ වුවද මේ පිළිබඳව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකළ අතර ණය හිමියන් වශයෙන් ද ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණ විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 හා 757(2) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| | (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | ආයතනය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ඡේදය | විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු. 3,110,500 ක් වූ පර්යේෂණ අධ්‍යයන කොන්ත්‍රාත් 3 ක් සඳහා පුද්ගලයින් තිදෙනෙකු තෝරාගෙන තිබුණි. |

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) 1994 මාර්තු 08 දිනැති අංක 26/92 (1) දරන චක්‍රලේඛය | රාජකාරි කටයුතු සඳහා භාවිතා කරන රථවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම ප්‍රදර්ශනය කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 5,411,945 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,805,575 ඌනතාවයක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,217,520 කින් වර්ධනය වී තිබුණි. විශේෂ ව්‍යාපෘති ආදායම රු. 9,524,436 කින් වැඩිවීම හා පරිපාලන වියදම රු. 735,384 කින් අඩුවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු. 8,575,023 ක්ව පැවති ආයතනයේ ඌනතාවය 2017 වර්ෂය වන විට රු. 5,411,945 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු. 16,721,542 ක්වූ ආයතනයේ දායකත්වය උච්ඡාවචනය වෙමින් 2017 වර්ෂය අවසන් වන විට රු. 37,685,852 ක් වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

ආයතනය විසින් 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණද, එය 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 04 වන වගන්තියේ සඳහන් තොරතුරු ඇතුළත් කර පිළියෙල කර නොතිබුණි. එසේම, විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කළ හැකි ක්‍රමවේදයක් ආයතනය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ පුහුණු වැඩසටහන් 22 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් වංචාවක් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයකට යටත් කර ඇති අතිරේක අධ්‍යක්ෂවරිය සහ උපදේශක ඉංජිනේරු යන ආයතනයේ විධායක නිලධාරීන් දෙදෙනා 2016 ජනවාරි සිට රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ නමුත් මෙම නිලධාරීන් දෙදෙනා සඳහා 2017 වර්ෂය වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු. 1,534,320 ක මුදලක් ගෙවා තිබුණි. ආයතනයේ මුළු සේවක පාරිශ්‍රමික වියදම වූ රු. 11,597,372 ක මුදලින් මෙම නිලධාරීන් සඳහා වූ දායකත්වය සියයට 16 ක් වුවත් රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කළ දින සිට මෙම නිලධාරීන්ගෙන් ආයතනයේ කාර්යසාධනය සඳහා කිසිදු දායකත්වයක් ලබා ගෙන නොතිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කළ චූදිත නිලධාරීන්ගේ ප්‍රවාහන දීමනා හා දුරකථන දීමනා ගෙවීම ආයතනය විසින් නතර කිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SCFR 233/2017 දරන නඩුව ගොනු කර තිබූ අතර ආයතනය විසින් මේ සඳහා පෙනී සිටීමට නිතීඥ ගාස්තු ලෙස මේ වන විට රු. 375.000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී සිදු වූ මුදල් වංචාවක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේදී සිදු වූ මුදල් වංචාවක් සම්බන්ධයෙන් සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණය මත 2017 ජූලි 21 දින පාලක සභාව අදාල රියදුරුගේ සේවය අත්හිටුවීමටත්, චූදිත රියදුරුගෙන් රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමටත් තීරණය කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කොටසේ XLVII පරිච්ඡේදයේ 23.9 වගන්තිය අනුව වැරදිකරු වූ නිලධාරියෙකුට දඬුවම් කළ යුතු දිනය වරද කළ දිනය ලෙස දක්වා තිබුණ ද ඒ අනුව කටයුතු නොකර සේවය අත්හිටුවීමට තීරණය ගැනීමට පාලක සභාව රැස් වූ 2017 ජූලි 21 දින සිට දඬුවම් නියම කිරීම හේතුවෙන් සේවය අත්හිටුවා තිබූ කාලය වෙනුවෙන් රු. 539,128 ක වැටුප් ගෙවා තිබුණි.

(iii) තවද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 13 වන වගන්තිය අනුව සේවා පාරිතෝෂික ගෙවීම් පනතේ 13 වගන්තිය අනුව කම්කරුවෙකු විසින් සේවායෝජකයෙකුට කරන ලද අලාභ හෝ පාඩුවේ ප්‍රමාණයට පාරිතෝෂික අහිමි කළ යුතු වුවත් එසේ කටයුතු නොකිරීම හේතුවෙන් රු. 187,596 ක් ගෙවා තිබුණි. ඒ අනුව ගෙවන ලද එකතුව රු. 726,724 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දේශන සඳහා බඳවා ගනු ලබන බාහිර සම්පත් දායකයින් සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ) කෙටි කාලීන පුහුණු වැඩසටහනක් තුළ අන්තර්ගත විෂයයන් සම්බන්ධයෙන් පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඊ) විධිමත් විනය පරීක්ෂණයකදී වරදකරු වීම හේතුවෙන් පාලක සභාව විසින් සේවයෙන් පහකිරීමට නියමකර තිබූ දෙදෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට පාරිතෝෂික සඳහා රු. 51,391 ක් වෙන්කර තිබුණි.

(ඇ) සේවයෙන් පහ කළ හා වැඩ තහනමට ලක් වීමෙන් පසු මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 623,297 ණය ශේෂ පොත්වලින් ලියා හැරීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරීන් 16 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 92,016 ක ණය ශේෂ දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබූ අවසන් තොගයේ වටිනාකම වූ රු. 1,686,163 තුළ පෙර වර්ෂවල සිට පැවත එන රු. 1,517,202 ක් වූ භාවිතයට ගත නොහැකි ප්‍රකාශන පොත්වලින් ඉවත් කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි .

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රේඛීය අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ පුනරාවර්තන ප්‍රතිපාදන රු. 35,000,000 ක් හා පුහුණු කිරීමේ වියදම් සඳහා වූ මූලධන ප්‍රතිපාදන රු. 57,250,000 න් රු. 30,200,000 ක් හෙවත් සියයට 53 ක් උපයෝජනය කර නොතිබුණි. රේඛීය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කළ විසර්ජන ගිණුමේ ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු ලෙස උපදේශකවරුන්ගේ හා වැඩසටහන් නිලධාරීන්ගේ පුරප්පාඩු හා පළාත් පාලන ආයතනවල නවක මන්ත්‍රීන් පත්වීම ප්‍රමාද වීම දක්වා තිබුණි. විගණනය සඳහා ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව පළාත් පාලන ආයතනවල සභිකයන් පුහුණු කිරීමේ වැඩසටහන් කිසිවක් හඳුනාගෙන නොතිබූ අතර උපදේශකවරුන්ගේ හිඟය මඟහරවා ගැනීම සඳහා බාහිර සම්පත් දායකයින් යොදාගත හැකිව තිබුණි.

## 4.4 විධිමත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

------------------------------------------------------------

ආයතනය සඳහා ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස තනතුරක් නොතිබියදී අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස ද මාසයකට රු. 60,000 බැගින් පසුගිය වර්ෂයේදී මාස 8 ක් සඳහා රු. 480,000 ක් ලබාගෙන තිබුණි. එයින් රු. 100,000 ක මුදලක් 2017 මාර්තු 22 දින ආපසු ගෙවා තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

ආයතනයේ කාර්ය මණ්ඩලයට ණය ලබාදීම සඳහා චක්‍රීය අරමුදලක් ලෙස ක්‍රියාත්මක විය යුතු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ 2017 ජනවාරි 01 දිනට ශේෂය රු. 4,399,788 ක් වූ අතර මෙම මුදල ආයෝජනයකට හෝ ස්ථාවර තැන්පතුවකට මාරු නොකිරීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

2017 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 49 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 36 ක් විය. 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 3 වගන්තිය ප්‍රකාරව ආයතනයට පැවරී ඇති කර්තව්‍යයන් පදනම් කරගනිමින් ආයතනය සඳහා ගැලපෙන ආකාරයට කාර්යමණ්ඩලය අනුමත කරවා ගැනීමට සහ දීර්ඝ කාලීනව පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර " 2030 න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

ආයතනය විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පමණක් සේවයේ යොදවා තිබුණ අතර වෙනත් කිසිදු නිලධාරියෙකු අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර නොතිබුණ බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

### 6.2 අයවැය ලේඛනය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වන වගන්තිය අනුව රජයේ සෑම නීතිගත සංස්ථාවක් විසින්ම අදාළ මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03කට නොවැඩි කාලයකට පෙර අයවැය ලේඛනයක් පිළියෙල කර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. එම අයවැය ලේඛනයෙහි අදාළ මුදල් වර්ෂය සඳහා අයවැයගත ලාභාලාභ ගිණුමක්, ශේෂ පත්‍රයක් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පෙන්නුම් කළයුතු බවට පනතේ 8(3) වගන්තියේ දක්වා ඇතත් එකී විධිවිධාන ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ආ) 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 03 වගන්තිය අනුව පළාත් සභා සහ පළාත් පාලනය ආයතනවල සභිකයින්, නිලධරයන් හා සේවකයන් පුහුණු කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ උපදේශන සේවා සැපයීම ආයතනයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ. ඒ අනුව ආයතනයේ මෙහෙයුම් වියදම් ඇස්තමේන්තු කිරීමේදී ආයතනයේ ප්‍රධාන මෙහෙයුම වන පුහුණු කිරීම ඇතුලත්ව පර්යේෂණ සහ උපදේශන සේවා ද සැළකිල්ලට ගෙන ඇස්තමේන්තු කිරීම වෙනුවට ප්‍රාග්ධන වියදම් යටතේ මානව සම්පත් සංවර්ධනය සඳහා රු. 57,250,000 ක් ඇස්තමේන්තු කර තිබුණි.

## 6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2016 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා මහල් 4 කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2013 වර්ෂයේ දී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන රු. 53,196,907 ක කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණු අතර ගොඩනැගිල්ලේ පයිල් අත්තිවාරම ඉදිකිරීම ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) යෝජිත මහල් 04 ක ගොඩනැගිල්ල මහල් 8 ක් දක්වා වැඩිකිරීමට 2013 නොවැම්බර් 04 දින ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කර ප්‍රධාන කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැනුම් දී තිබුණ ද ඒ සම්බන්ධව ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරු දැනුවත් නොකිරීම හේතුවෙන් මහල් 4 කට පමණක් ප්‍රමාණවත් පරිදි පයිල් අත්තිවාරම ඉදිකර තිබුණි.

(ii) පයිල් අත්තිවාරම් ඉදිකිරීම අධීක්ෂණය කිරීම සඳහා ආයතනය විසින් උපදේශාත්මක සමාගමක් හෝ පුද්ගලයෙකු පත්කර නොතිබුණි. උපකොන්ත්‍රාත්කරුගේ වැඩ අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් අධීක්ෂණ වියදම් ලෙස රු. 755,709 ක් බිල්කර තිබුණ ද ඉදිකර තිබුණු පයිල් සඳහා සිදුකළ යුතු තාක්ෂණික පරීක්ෂණ කිසිවක් සිදුකර නොතිබුණු අතර උපකොන්ත්‍රාත්කරු විසින් ද එම පරීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ඉදිකර තිබුණු පයිල්, පරීක්ෂා කිරීමකින් තොරව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු වෙත රු. 38,147,381 ක් ගෙවා තිබුණු අතර පයිල් යා කර කොන්ක්‍රීට් තට්ටු (Pile Cap) යොදා තිබීම නිසා ඒවා පසුව පරීක්ෂා කිරීමට නොහැකි තත්ත්වයක පැවතුණි.

(iv) පයිල් තට්ටු (Pile Cap) යොදා නොතිබුණු පයිල් 02 ක් සඳහා පමණක් ආයතනය විසින් පසුව PDA පරීක්ෂණය සිදුකර තිබුණි. ඒ අතරින් එක් පයිල් එකක් අවශ්‍ය ගුණාත්මකභාවය නොමැති බව තහවුරු කරගෙන තිබුණු අතර ඉතිරි පයිල් සියල්ලෙහිම ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු කර නොතිබුණි. ඒ අනුව ඒවා මත ගොඩනැගිල්ල ඉදිකිරීම සුදුසු නොවන බව ආයතනය විසින් පිළිගෙන ඇති බැවින් මේ සඳහා දරන ලද රු. 44,757,072 ක වියදම නිෂ්කාර්ය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6.5 සමාජ වගකීම් ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට අදාළ පාරිසරික හා සමාජ වගකීම් හඳුනාගෙන නොතිබුණි.

(ආ) අපද්‍රව්‍ය කළමනාකරණය පළාත් පාලන ආයතනවල ප්‍රධාන කර්තව්‍යයක් වුවද ඊට අදාළ කිසිදු පුහුණු වැඩසටහනක් හෝ වැඩමුළුවක් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

----------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|
| ස්ථාවර වත්කම් පාලනය. | ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි පරිදි පවත්වා නොගැනීම. |
| ගිණුම්කරණය. | ක්ෂය සඳහා වෙන්කිරීම් කිරීමේදී දුර්වලතාවයන් පැවතීම. |
| කාර්ය මණ්ඩල පරිපාලනය. | පුද්ගලික ලිපි ගොනු නිසි පරිදි පවත්වාගෙන නොයාම, වැටුප් වර්ධක ලබා නොදීම, විනය සම්බන්ධ කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හා ආයතනයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය නොකිරීම. |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම. | ආයතනයේ වර්තමාන කාර්ය මණ්ඩලයෙන් උපරිම දායකත්වය ලබා නොගැනීම හා අනුමත දීමනා යටතේ බාහිර සම්පත් දායකයින් යොදාගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දුර්වලතාවයන් පැවතීම. |